ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | **සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව** |
| දිනය | **2012.06.06** |

## සේවක අර්ථසාධක අරමුදල ආයෝජන ප්‍රතිපත්ති මාර්ගෝපදේශ අනුගමනය කර ඇති බව යළිත් අවධාරණය කරයි

සේවක අර්ථසාධක අරමුදල කොටස් වෙළෙඳ පොළ ආයෝජනයන් සිදු කිරීමේ දී ආයෝජන ඇගැයීම හා විශ්ලේෂණය කිරීම සියලු අභ්‍යන්තර ආයෝජන ප්‍රතිපත්ති මාර්ගෝපදේශයන්ට අනුකූලව සැලකිලිමත් ලෙස සිදු කර ඇති බව යළිත් අවධාරණය කරයි. සේවක අර්ථසාධක අරමුදල මීට පෙර ද කිහිපවරක් මේ බව ප්‍රසිද්ධියේ සහතික කර තිබුණ ද කණගාටුවට කරුණක් වන්නේ ඇතැම් විරුද්ධ පාක්ෂික පාර්ලිමේන්තු මන්ත්‍රීවරු පිරිසක් විසින් එකී පැහැදිලි කිරීම් පිළිගැනීමට අකමැති වෙමින් සේවක අර්ථසාධක අරමුදල ආයෝජන කටයුතු වලදී අභ්‍යන්තර මාර්ගෝපදේශ උල්ලංඝනය කර ඇති බවත් අරමුදල ඒ කරුණ පිළිබඳව ප්‍රතිචාරයක් නොදක්වන බවත් චෝදනා කර සිටීමයි. මෙවැනි තත්ත්වයක් තුළ, සේවක අර්ථසාධක අරමුදල කොටස් වෙළෙඳ පොළ තුළ සිදුකර ඇති සියලුම ආයෝජනයන් අභ්‍යන්තර මාර්ගෝපදේශයන්ට අනුකූලව යමින්, ආයෝජන කමිටුවේ සහ මුදල් මණ්ඩලයෙහි අනුමැතියට යටත්ව සිදු කර ඇති බව ස්ථිර වශයෙන්ම නැවත වරක් ප්‍රකාශ කර සිටියි.

මෙම පසුබිම තුළ පැහැදිලි වන්නේ ඇතැම් විරුද්ධ පාක්ෂික පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කිහිප දෙනෙකු විසින් පුනපුනා නගනු ලබන මෙම චෝදනාව පදනම් විරහිත බවය. සේවක අර්ථසාධක අරමුදල සමස්ත මූල්‍ය පද්ධතියේ සැලකිය යුතු කොටසක් වන බැවින් ප්‍රකෝපකාරී ලෙස මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව බිඳ දැමීම සඳහා කරනු ලබන සැලසුම්සහගත ප්‍රයත්නයක කොටසක් ලෙස මෙම අභූත චෝදනා හැඳින්විය හැකිය. ඒ අනුව, මෙවැනි දේශපාලනික පෙළඹවීම් සහිත පදනම් විරහිත චෝදනාවලින් නොමග නොයන ලෙස මහජනතාව වෙත සේවක අර්ථසාධක අරමුදල වගකීමෙන් යුතුව දන්වා සිටියි.